වයඹ පළාතේ පළාත් සභාවේ 1998 අංක 05 දරණ වයඹ

පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාර වරයා අනුමත කළ දිනය: 2002.03.05)

වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 05 දරණ වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

| | | |
|---|---|---|
| ලුහුඬු නාමය | 1. | මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1998 අංක 05 දරණ වයඹ පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. |
| 1995 අංක 05 දරණ ප්‍රඥප්තියේ 11(2) වැනි වගන්තිය සංශෝධනය කිරීම. | 2. | මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 05 දරණ වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 11(2) වගන්තිය ඉවත් කොට මතු කියවෙන වගන්තිය ආදේශ කිරීමෙන් සංශෝධනය කිරීම. |

11(2) (1) වැනි උප වගන්තියෙන් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ක්‍රියාවෙහි යෙදවීමේදී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ හෝ නිශ්චය කිරීම් වෙනස් කිරීම, අවලංගු කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම හෝ ඉවත දැමීම හෝ කොමිෂන් සභාව විසින් කළ හැකිය.

*****************

කුමාරි/-